සුබ පැතුම්! Greetings! සුබ පැතුම්! Greetings!

මගේ උණුසුම් සුබ පැතුම්!

මම ද ලන්ඩනයේ පළවන ලංකාවිත්ති සුන්දර පුවත්පතේ පාඨකයෙක්මි. එය මට නිතිපතා මෙහි ලංකාවේ මගේ නිවසට ලැබේ. එහි පළවන අප හදට අනුකූල බොහෝ විචිත්‍ර දෑ කියවා නොමඳ රසයක් විඳිමි. විදේශයක අද ජීවත් වුවද තම උපන් රට වෙනුවෙන්, තම මව්බස වෙනුවෙන් ලබැදි දයා ආනන්ද රණසිංහ සොහොයුරා විසින් කරනු ලබන මෙම සද් කාර්‍යයට, අමිල සේවයට වසර පහළොවක් සම්පූර්ණ වන අද දින තුති මල් මිටක් පුදමි.

මෙම පුවත් පතෙහි දසවන සංවත්සරය පැවැත්වෙන විට, එනම් දැනට පස් වසරකට පෙර, මා සිටියේ ලන්ඩනයේ මගේ සංගීතමය චාරිකාවක යෙදෙමිනි. එදා ඒ දසවස් උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් මට ආරාධනා කර තිබුණි. මම එයට ඉතා ප්‍රීතියෙන් සහභාගි වීමි. විශාල පිරිසක් එදා ලන්ඩනයට ඒ සඳහා රැස්ව සිටි අතර, ඒ පුවත්පතට පාඨක ජනතාව දක්වන සෙනෙහස, ඇල්ම මම එදා හොඳින් වටහාගත්තෙමි. පසළොස් වසරක් විදේශයක සිට සිහළ නැණ පහන් දැල්වූ ලංකා විත්ති පුවත්පත ලෝ තුළහි චිරාත් කාලයක් බැබළේවා!

♦ ***සංගීතවේදී***
වික්ටර් රත්නායක
ඔරුවල Sri Lanka

ලංකා විත්තියට සුබාසිරි!

එංගලන්තයේ සංස්කරණය කර, මුද්‍රණය කර පළකෙරෙන ලංකා විත්ති සිංහල පුවත් පත මම බොහෝ කාලයක සිට අකුරක් නැර කියවන කෙනෙක්මි. එහි අන්තර්ගතය සිංහල බස, හැදියාව පෝෂණය කරන්නකි. එහි ජාති වාත්සල්‍යය වඩවන ලිපි හා කවි නිතර පළකරනු දක්නා ලැබේ.

සිංහල මුද්‍රණ පහසුකම් සහ සිංහල පත්‍රයකට අවශ්‍ය අමු ද්‍රව්‍ය ලංකාවෙන් බැහැර රටකදී සපයා ගැන්ම ඉතා දුෂ්කර කාර්‍යයක්ව තිබියදී ලංකාවිත්ති පුවත් පත කිසිදු අඩු පාඩුවකින් තොරව පහළොස් වසක් එංගලන්තයේ මදණයෙන් එළි දැකීම සැබැවින්ම ආශ්චර්‍යයකි.

අපේ රට ත්‍රස්තවාදී උවදුරට මුහුණ පා සිටි සමයේ පිටරට සහ ශ්‍රීලංකාවේ වෙසෙන අපේ ජනතාව ඒ පිළිබඳ අවදියෙන් තබා රට රැක්මට දේශප්‍රේමීන් ඒකරාශීකිරීමේ කාර්යයට ලංකාවිත්ති පුවත්පත උරදී සිටි සැටි අපට හොඳින් මතකය.

ලංකාවිත්ති පුවත් පත සිය පසළොස්වන සංවත්සරයට එළඹ ඇති මේ අවස්ථාවේ සිංහල පාඨක සිත් පොබකරමින් එම පුවත්පත තව දීර්ඝ කාලයක් යෙහෙන් වැජඹේවා! යි සුබාසිරි පතමි.

♦ ***දයාවංශ ජයකොඩි***
දයාවංශ ජයකොඩි සහ සමාගම
කොළඹ Sri Lanka

අප පුවත්පතේ 15 වන සංවත්සරයට ලැබුණු සුබ පැතුම් බොහෝ ය. විශාල ප්‍රමාණයක් ගිය කලාපයේ පළකළෙමු. මේ ලැබුණු තවත් සුබ පැතුම්ය. අපට විශාල සතුටකි. ඔබ සියළු දෙනාටම ස්තූතියි !
- ලංකා විත්ති -

ලංකාවිත්ති සාර සංග්‍රහය

1997 වසරේ අංකුරයක් ලෙස එංගලන්තයේ ජනිත වූ ලංකාවිත්ති පුවත්පත පසළොස් වැනිවිය සපුරා අද වන විට අතුපතර විහිදී ගිය මහා වෘක්ෂයකි. ආගමික, සාමාජයික, සංස්කෘතික, දේශපාලනික, ඓතිහාසික හා විනෝදාත්මක ආදී නන් වැදෑරුම් තේමාවන් ඔස්සේ ගලා යන අමාවන් මල් හා ඵල පාඨක ජනයා නමැති විහඟ හා බමර කැලගේ රසාස්වාදය නමැති ආශාව සන්තර්පණය කරන බව නොරහසකි. ගුණාත්මකව හා හරබරව මෙම පුවත්පත එළි දැක්වීමට එහා කතුවරයාණන් වූ දයා රණසිංහයන් දරන වෙහෙස මහන්සිය සැබැවින්ම අප හැම දෙනා විසින්ම අගය කළ යුත්තකි. ඔහුගේ එම ව්‍යායාමය හුදෙක් ආර්ථිකමය වූ වාසි තකාගෙන නොව අපේකම හෙවත් සිංහලකම ආරක්ෂාකර ගැනීමේ පරම පිවිතුරු පරමාර්ථය මත ම පදනම් වූවකි.

හිතවත් කීපදෙනෙකුගේ පමණක් සහා යෙන් සෑම මසකම එළිදක්වන ලංකාවිත්ති සාර සංග්‍රහය අන්තර්ජාලය ඔස්සේ කිය වීමට හැකියාව ලබාදීමෙන් ලොව පුරා බොහෝ පාඨකයන්ගේ අගැයීමටද ලක්ව ඇත.

දස වසරකට වඩා වැඩි කාලයක් බ්‍රිතාන්‍යයේ හා ඉන් බාහිරවද සිංහලය රුචිකරන බොහෝ පාඨකයින්හට තම දිවිය යම් පමණකට හෝ සරුකරගැනීමට සිතන්නට යම් උපදෙසක් ලබාදීමට අපට හැකිවීම පිළිබඳව හිතවත් ආනන්ද රණසිංහයන්ට ඉන් ලැබෙන පින් ද පමුණුවන්නේ තව දුරටත් ඔහුගේ එම සත්කාර්යය වඩාත් සාර්ථකව කරගෙන යෑමට කායික හා මානසික සුවය ලැබේවායි යන අවංක ප්‍රාර්ථනාවෙනි.

♦ ***රාජකීය පණ්ඩිත***
පූජ්‍ය විල්ඔයේ විමලජෝති හිමි
ගල්ටැම්මණ්ඩිය පුරාණ විහාරය
ඔක්කම්පිටිය මොණරාගල
Sri Lanka

ලන්ඩනයේ ශ්‍රීලංකා මහා ක්‍රිකට් සැණකෙළිය
Sunday 8th July 2012

දිගු කල් පවතීවා !

එංගලන්තයේ මුද්‍රණයකර ලංකාව ඇතුළු බොහෝ රටවල නොමිළයේම බෙදා හරින ලංකාවිත්ති පුවත්පත ශ්‍රීලංකාවේ බෙදා හැරීම සිදුකෙරෙන එක් ආයතනයක් වන්නේ නුගේගොඩ අප සරසවි පොත්හළයි. පසුගිය පහළොස් වස පුරාම ශ්‍රී ලංකාවේ පාඨකයින් වෙතට ලංකාවිත්ති ළං කරවන්නට අපට හැකිවීම සතුටකි.

ලංකාවිත්ති කතුවර දයා රණසිංහ මහතා හුදෙ-ක් අප රටට, දැයට, බසට ඇති ඉමහත් ඇල්ම නිසාම මහත් දුෂ්කරතා මැද කිසිදු මුදල්මය බලාපොරොත් තුවක් නැතිව නොමිළේම ඉතා අගනා පුවත්පතක් සිංහල පාඨකයින්ට තිළිණ කරයි. ඒ කාර්‍යයට ඒ මහතාට සිංහල පාඨකයින්ගේ ප්‍රශංසාව හිමිවන බවට සැක නැත. හැකි අයුරින් ඊට අත හිත දෙන්නට අපට ද හැකිවීම සතුටකි.

ලංකාවිත්ති දිගුකලක් අප රටේ හිත සුව පිණිස පවතීවා! යි මෙම පහළොස්වන සංවත්සරයේදී අපි ඉත සිතින් ආසිරි පතමු.

♦ ***එච්. ඩී. ප්‍රේමසිරි***
සරසවි ප්‍රකාශකයෝ නුගේගොඩ Sri Lanka

නොව පැරණිය වන රමණීය - පුවත්පත

“ **අ**පි සිංහළ පත්තරයක් ගහන්නයි යන්නෙ ඔයාට පුලුවන්ද මොනව හරි ලියන්න ? ”

“ හොඳයි ”

එවැනි දෙබස් කීයක් මා හා ලන්ඩනයේ වෙසෙන කී දෙනෙක් අතර වෙන්නට ඇද්ද?

ලන්ඩනයට සිංහළ පත්තර ආවෝය. සිංහල පත්තර ගියෝය. අවුරුදු පහළොවකට කලින් දයා ආනන්ද පත්තරයක් ඇරඹුවේය. එය ලංකාවෙන් බැහැර ලෝකයේ පළවූ ප්‍රථම සිංහළ පත්තරයයි. එය අදත් අප සිත් සතන් පුබුදුවා ලමින් නොකඩවා ලොව දස දෙස බෙදී යයි.

මම පත්තරකාරයින් ගණනාවක් හඳුනමි. කීප දෙනෙකු ආශ්‍රය කරමි. එහෙත් දයා වැන්නෙක් ඒ අතර නැත. ලංකා විත්තියෙහි කතු වරයා ඔහුය. අකුරු අමුනන්නා ඔහුය. අයිති කාරයාද ඔහුය. යහලුවෙක් සමග හෝ තනිව හෝ වාහනයකින් හෝ උමං දුම්රියෙන් හෝ ගොස් පත්‍ර බෙදාහරින්නේ ද ඔහු ය.

“ මව, ලංකාවට යන කවුරු හරි ඉන්නවද? තව පත්තර ටිකක් ඉක්මනට ලංකාවට යවන්න තියනවා.” ඒ දයාගේ නොයිවසිල්ලයි

ගිය ජනවාරියේ දිනක ප්‍රංශයට ලංකාවිත්ති යැවීමට පැරිසියට යන කෙනෙක් එන තෙක් දයා සමග මම ද ලන්ඩනයේ සැන් ප්‍රැන්ක්‍රාස් දුම්රිය පොළේ යුරෝ ස්ටාර් පිටත්වන ගේට්ටුව අසළ සීතලේ ගැහෙමින් පැය දෙකක් රැඳී සිටියෙමි. ඒ යන කෙනා ආවේ නැත එහෙත් ඔහුගේ මුහුණේ බලාපොරොත්තු කඩවීමක් අධෛර්‍යවීමක් නුදුටිමි. “ කමක් නැ තව එක්කෙනෙක් අද හෙටම මම කොහොම හරි සොයාගන්නවා.” ඔහු කීය. දයාගේ කැපවීම එබඳු ය.

පසුගිය අවුරුදු පහළොවේ මුද්‍රිත ලංකාවිත්ති කලාප බොහො මයක් මා ළග ඇත. එකක් දිග හැරියොත් මුලු පුවත්පතම කියවා මිසක අහක තැබීමට සිත් නොදෙයි. ඒ පැරණි කලාප තුළ වුවද නවතාවක් තවමත් නොඅඩුව තිබේ. ලංකාවිත්තියෙහි ලකුණ එයයි. මහාචාර්ය සරච්චන්ද්‍ර මහතාගේ තලුමරමින් කියවීමේ න්‍යාය ලංකා විත්තියටද පොදුය.

♦ ***නිතිඥ අනුර හෑගොඩ***
London WC2

චිරං ජයතු ලංකා විත්ති !

විදේශයක සිට සිංහල පුවත්පතක් පළ කිරීම දුෂ්කර ක්‍රියාවකි.
පසළොස් වසරක් තිස්සේ නොකඩවා එවැන්නක් කරගෙනයාම විස්මයාවහ කාර්යයකි.
මේ කර්තව්‍යය නිහතමානීව සාක්ෂාත් කරගත් මිහිපිට වැසි එකම පුවත්පත් කලාවේදියා දයා ආනන්ද රණසිංහයෝ වෙති.
ප්‍රවීණ මෙන්ම, ආධුනික කලාකරුවන්ටද තම හැකියාවන් ඉස්මතු කර දැක්වීමට වේදිකාවක් සැපයූ ලංකා විත්ති පුවත් පත ඕස්ට්‍රේලියානු වාසි සිංහලයෝ අතිශයින් අගය කරති.
පසලොස්වැනි නාඹර වියට එළඹෙන මේ සුකොමළ තරුණියට මා සුබ පතන්නේ දුර ඈතක සිට ළඳකගේ සිරි නරඹන විතරාගි අරවින්දයෙකු මෙනි.

♦ **මෛත්‍රී පනාගොඩ**
Sydney Australia

ලංකා විත්ති සදා දිනේවා!

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය යන මිළ කළ නොහැකි අගනා රුවන් වැකිය මුල්කොට ගනිමින් ලන්ඩන්හි මුද්‍රණය වී ලොව වටා සේවයෙහි නියුතු ශ්‍රී ලාංකික අප අතට නොමිළේ පත්වන අපේ ලංකාවිත්ති පුවත් පතට අභිමානවත් 15 වන වසර සපිරෙන මෙම මාසය සයිප්‍රස් රාජ්‍යයෙහි වෙසෙන ශ්‍රී ලාංකික පාඨකයින්ගේද උණුසුම් සුභ පැතුම් මෙසේ පුද කරමු.

විශේෂයෙන් මෙම පුවත් පත බොහෝ දෙනා අතර ඉතාමත් ජනප්‍රියත්වයට හා අගැයීමට පත්ව ඇත්තේ එහි ඇති හරබර ලිපි හා විදෙස් පුවත් මෙන්ම, අප මව්බිම තොරතුරුද, ආගම දහම වෙනුවෙන්ද එහි මුල් තැන දී ඇති බැවිනි. එහි ප්‍රධාන කතෘතුමන් වන දයා ආනන්ද රණසිංහ මැතිතුමන් එහි සමබර තාව පවත්වා ගනිමින්, මධ්‍යස්ථව හිඳිමින් අඛණ්ඩව වසර 15 පුරා ආ ගමන් මග නිසාම එහි ඇති සාර්ථකත්වය මනාව පිළිබිඹු වේ.

විශේෂයෙන් මෙම සයිප්‍රස් රටට තැපැල් මගින් කිසිදු අය කිරීමකින් තොරව ලංකා විත්ති පුවත් පත ලබා දෙනවා පමණක් නොව මෙහි සිදු කරන ජාතික ආගමික හා සංස්කෘතික වැඩ සටහන් වල විස්තරද පළකිරීමට පවා වූ ඔබේ නිහතමානී බව අපි අගය කරන්නෙමු.

මෙම මහඟු වූ සමාජ සත්කාරය ඉදිරියටම සාර්ථකව කරගෙන යෑමට රත්නත්‍රයේ පිහිටද, අවැසි ශක්තිය හා ධෛර්‍යය ලැබේවායි ප්‍රධාන කතුතුමන් ඇතුලු සමස්ථ කතු මඩුල්ලට අපගේ ආශීර්වාදය පුද කරන්නෙමු!

♦ ***විමලා යාපා - සයිප්‍රස් සිට - Cyprus***